**චක්‍රලේඛය 2018 අංක 01** 2018 මාර්තු 13

## ණය ශ්‍රේණිගත කිරීම්

සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ණය ශ්‍රේණිගත කිරීමට අදාලව පහත සඳහන් මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමට මෙමගින් නියම කෙරේ.

| | | | |
|---|---|---|---|
| 1. | මූලික කාල රාමු | 1.1 | සමාගම වෙත ණය ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනයක් සමඟ 2018 අප්‍රේල් මස 30 වන විට ගිවිසුමකට එළඹ පහතින් අත්සන් කර ඇති පාර්ශවය වෙත දැනුම් දීම. |
| | | 1.2 | සමාගම සඳහා එවන් නියෝජිත ආයතනයක් මගින් ප්‍රසිද්ධ කර පළ කල හැකි ණය ශ්‍රේණිගත කිරීමක් 2018 ඔක්තෝබර් 01 වන විට ලබා ගැනීම. |
| 2. | ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන ලැයිස්තුව | 2.1 | මේ සඳහා පහත සඳහන් ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතනයන් ගෙන් එක් ආයතනයක් තෝරා ගත යුතුය.<br>අ. ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ්<br>ආ. ඉක්රා ලංකා ලිමිටඩ් |
| | | 2.2 | ඉහත 2.1 හි සඳහන් ලැයිස්තුවෙහි වෙනස්කම් වෙතොත් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සුදුසු කටයුතු සඳහා දැනුම් දෙනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| 3. | වෙනත් කොන්දේසි | 3.1 | 2018 ඔක්තෝබර් මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි අදාල ණය ශ්‍රේණිගත කිරීම, මහජනතාවගෙන් තැන්පතු සහ ණය රැස්කිරීම සඳහා යොදා ගනු ලබන ප්‍රචාරණ කටයුතු වලදී, ආයතනික වෙබ් අඩවියෙහි, ප්‍රකාශිත මූල්‍ය වර්තාවල සහ ආයතන පරිශ්‍රයන් හි ප්‍රදර්ශනය කල යුතුය. |
| | | 3.2 | ණය ශ්‍රේණිගත කිරීම වසරකට වතාවක් හෝ යාවත්කාලීන කළ යුතු අතර අදාළ ශ්‍රේණිගත කිරීමේ වාර්තාව එය ලබාගත් දින සිට මසක් ඇතුලත බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය. |

ඩබ්. රණවීර

**වැඩ බලන අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය**
**ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**